### ආරක්ෂක අමාත්‍යාංශය

# ජාතික ගොඩනැගිලි පර්යේෂණ සංවිධානය (NBRO)

# පුරප්පාඩු

ජාතික ගොඩනැගිලි පර්යේෂණ සංවිධානයේ (NBRO)හි පවතින පහත සඳහන් පුරප්පාඩු සඳහා ශ්‍රී ලාංකීය පුරවැසියන්ගෙන් අයදුම්පත් මෙයින් කැඳවනු ලැබේ.

**ජ්‍යෙෂ්ඨ විද්‍යාඥ ඉංජිනේරු (සිවිල්/ද්‍රව්‍ය)/ භූ විද්‍යාඥ / නගර නිර්මාණ ශිල්පී/ තොරතුරු තාක්ෂණික හෝ වෙනත් අදාළ විෂය ක්ෂේත්‍රය (AR - 2 (තනතුරු 08)**

**ජ්‍යෙෂ්ඨ විද්‍යාඥ :**

**ඉංජිනේරු (සිවිල්/ ද්‍රව්‍ය)**

**(සිවිල් ඉංජිනේරු තනතුරු සඳහා භූ තාක්ෂණ ඉංජිනේරු හෝ - 04**
**ව්‍යුහාත්මක ඉංජිනේරු ක්ෂේත්‍රයේ පළපුරුදු අයදුම්කරුවන් හට ප්‍රමුඛතාව ලැබේ.)**

**භූ විද්‍යාඥ - 02**

**නගර නිර්මාණ ශිල්පී/ තොරතුරු තාක්ෂණික හෝ අදාළ විෂය ක්ෂේත්‍රයක - 02**

**බාහිර :**

**සුදුසුකම් (පහත 1 හෝ 2)**

(1). විශ්වවිද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාව (UGC) විසින් පිළිගනු ලබන විශ්වවිද්‍යාලයකින් ලබාගත් උචිත විෂය සංකලනයෙන් යුක්තව අදාල ක්ෂේත්‍රයේ ඉංජිනේරු විද්‍යාව/ විද්‍යාව/තාක්ෂණවේදය පිළිබඳ සිව් අවුරුදු ප්‍රථම (Bachelor's) උපාධිය.

**සහ**

අදාල ක්ෂේත්‍රයේ පිළිගත් වෘත්තීයවේදී ආයතනයක ආයතනික (Corporate) සාමාජිකත්වය හෝ පශ්චාත් උපාධි සුදුසුකම් (මාස්ටර්)

**සහ**

ප්‍රථම උපාධිය ලැබීමෙන් පසු රජයේ සංස්ථාවක, මණ්ඩලයක ව්‍යවස්ථාපිත ආයතනයක හෝ පිළිගත් පෞද්ගලික අංශයේ ආයතනයක පර්යේෂණ හා සංවර්ධන කටයුතු පිළිබඳ අවම වශයෙන් වසර අටක (08) පළපුරුද්ද

(2). විශ්වවිද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාව (UGC) විසින් පිළිගනු ලබන විශ්වවිද්‍යාලයකින් ලබාගත් උචිත විෂය සංකලනය සහිත තනතුරට අදාල ක්ෂේත්‍රයේ හෝ ඉංජිනේරු විද්‍යා / විද්‍යාව/ තාක්ෂණ වේදය පිළිබඳ විශේෂ උපාධියක්

**සහ**

අදාල ක්ෂේත්‍රයේ ආචාර්ය (Ph.D - දර්ශන ශුරී) උපාධියක්

**සහ**

ප්‍රථම උපාධිය ලැබීමෙන් පසු රජයේ සංස්ථාවක, මණ්ඩලයක ව්‍යවස්ථාපිත ආයතනයක හෝ පිළිගත් පෞද්ගලික අංශයේ ආයතනයක පර්යේෂණ කටයුතු පිළිබඳ අවම වශයෙන් වසර පහක (05) පළපුරුද්ද.

**සැ.යු :** අදාල විෂය ක්ෂේත්‍රයේ පර්යේෂණ ප්‍රකාශන පළකර තිබීම අමතර සුදුසුකමක් වනු ඇත.

**වැටුප් පරිමාණය :** AR – 2, Gr.ii Rs.76,200 - 10 X 2,000 - 96,200

(මෙම වැටුප් පරිමාණයේ ආරම්භක වැටුප් තලයේ පිහිටවනු ලැබේ.)

**වයස :** අවුරුදු 30 ට නොඅඩු සහ 55 ට නොවැඩි විය යුතුය.

අභ්‍යන්තර අයදුම්කරුවන් සඳහා ඉහත වයස් ප්‍රමාණය අදාල නොවේ.

**වෙනත් ප්‍රතිලාභ**

- ජීවන වියදම් දීමනාව
- සංවිධානය විසින් සේවක අර්ථ සාධක අරමුදලට 12% ක් සහ සේවා නියුක්තයින්ගේ භාර අරමුදලට 3% ක්ද වශයෙන් දායක වනු ඇත.
- රජයේ චක්‍රලේඛ අනුව වෛද්‍ය නිවාඩු සහ ප්‍රසාද දීමනා ගෙවනු ලැබේ.
- කාර්යසාධනය පදනම් කරගෙන දිරි දීමනා ගෙවීම.
- ජීවිත රක්ෂණ ආවරණය සහ වෛද්‍ය රක්ෂණ ආවරණය
- සන්නිවේදන දීමනා
- වෘත්තීය පරිසරය තුළ වැඩ කිරීමේ අවස්ථාව
- රජය විසින් අනුමත වෙනත් දීමනා

රජයේ දෙපාර්තමේන්තු, සංස්ථා, ව්‍යවස්ථාපිත මණ්ඩලවල සේවයේ නියුතු අයදුම්කරුවන්, ස්වකීය අයදුම්පත්, අදල ආයතන ප්‍රධානීන් මාර්ගයෙන් ඉදිරිපත් කළ යුතුය. අයදුම් කරන තනතුර කවරයේ වම්පස ඉහළ කෙලවරේ, පැහැදිලිව සටහන් කළ යුතුය. සියලු ජීව - දත්ත තොරතුරු සහිත අයදුම්පත් අදල සහතිකවල පිටපතක්ද සමග 2025.03.07 වන දින හෝ ඊට පෙර කොළඹ 05, ජාවත්ත පාරේ, අංක 99/1, ජාතික ගොඩනැගිලි පර්යේෂණ සංවිධානයේ අධ්‍යක්ෂක ජනරාල් වෙත ලැබෙනසේ ලියාපදිංචි තැපෑලෙන් එවිය යුතුය.

**අධ්‍යක්ෂ ජනරාල්,**
**ජාතික ගොඩනැගිලි පර්යේෂණ සංවිධානය,**
**99/1, ජාවත්ත පාර,**
**කොළඹ 05.**